





මෝටර්රථ ආදර්ශ කලාප දෙකක්

ශ්‍රී ලංකාවේ මුල්ම මෝටර් රථ තාක්ෂණ සඟරාව **මෝටර්රථ** නමින් 1995 ජනවාරි මස සිට ප්‍රකාශයට පත්වීම ආරම්භ වූ අතර කලාප 20 කින් අවසන් කරන ලදී. මෙය උසස් මෝටර් රථ තාක්ෂණය සඳහා වෙන් වූවකි.







සිප්රථ ආදර්ශ කලාප දෙකක්

උසස් මෝටර් රථ තාක්ෂණය සඳහා මෝටර්රථ සඟරාව නිකුත් වීමත් සමඟ පාඨක ඉල්ලීම මත සාමාන්‍ය මෝටර් රථ තාක්ෂණය සඳහාද සඟරාවක් 1996 මාර්තු මස සිට ප්‍රකාශයට පත් කරන ලදී එය නම් කෙරුණේ **සිප්රථ** නමිනි.







රියසකි ආදර්ශ කලාප දෙකක්

දමුතු තාක්ෂණ ප්‍රකාශන ආයතනය ලක්හඬ ගුවන් විදුලිය හා එක්ව ප්‍රකාශයට පත්කල **ලක්හඬ රියසකි** වැඩසටහන හා සම්බන්ධව **රියසකි** යන සඟරාව ප්‍රකාශයට පත් කෙරුනි. එය කලාප 50 කට පසු නතර කරනු ලැබුවේ මෙම වෙබ් අඩවිය සකස් කිරීම සඳහාය. ඉදිරියේදී නැවතත් මෙම සඟරාව වෙනත් ආරෙකින් මෙන්ම වෙනත් නමකින් නැවතත් ආරම්භ වනු ඇත.

**මෙම වෙබ් පිටුව සකසා ඇත්තේ රියසකි මාසික සඟරාවේ පළවූ ට්‍රැක්ෂන් කොන්ට්‍රෝල් වර්ග පිළිබඳව වූ ලිපි පෙළ ඇසුරිනි.**

## ■ HAC (Hill Assist Control) පද්ධතිය

මෙයට පෙර අපි අධ්‍යයනය කර ඇති HSA (Hill Stop Assist) පද්ධතියට සමාන අයුරින් මෙම HAC (Hill Assist Control) පද්ධතිය ක්‍රියාකරයි. මෙහි ඇතිවෙනස HSA ක්‍රමය විශේෂයෙන්ම මැනුවල් ගියර සඳහා යොදා ගැනුනත් HAC ක්‍රමය ඔටෝ ගියර රථ සඳහා පමණක් යොදා ගැනීමයි.




මෙහි දක්වා ඇත්තේ ඔටෝ ගියර රථයක් කන්දකදී ගමන් ආරම්භ කරන විට ඇතිවන අපහසුතාවයකි. එනම් මෙහිදී රියදුරු බ්‍රේක් පැඩලයෙන් පය ඇක්සලරේටරයට මාරු කරන පමාව ඇතුලත රෝද හතර ආපස්සට කැරකී රථය පසුපසට තල්ලුවීම සිදුවෙයි. ඒ අතරම ඇක්සලරේටරය තද කල විට පසුපසට කැරකීමට උත්සාහ ගත් රෝද හතර නැවත ඉදිරියට ගමන් කිරීමට උත්සාහ ගනියි. මෙහිදී ටෝක් කන්වර්ටරයට පමණක් නොව ඇතුලත එපිසයික්ලික් ගියර ක්ලච් වලටද හානි ඇති කරයි. HAC ක්‍රමය මගින් මෙම දෝෂය පිටුදැක ඇති අයුරු පහත සටහනෙන් දක්වා තිබෙයි.




මෙහි දක්වා ඇත්තේ HAC සහිත රථයක කන්දක ගමනාරම්භය ඉතා පහසුවන ආකාරයයි. මෙහිදී රියදුරු රථය පිකප් කිරීම සඳහා බ්‍රේක් පැඩලයෙන් පය ඉවත් කිරීමත් සමඟම ස්කිඩ් කොන්ට්‍රෝල් පද්ධතිය මගින් රථයේ රෝද පසුපසට කැරකෙන බව අවබෝධ කරගත් සැනින් තත්පර 5 ක කාලයක් දක්වා සාමාන්‍ය පීඩනයකින් යුතුව පද්ධතියේ බ්‍රේක් යොදනු ලැබෙයි. එම කාලය තුල රියදුරුට බ්‍රේක් පැඩලයෙන් ඇක්සලරේටර පැඩලයට පය මාරු කිරීමට හැකිවේ.

HAC ක්‍රියාකාරීත්වය සඳහා පහත සඳහන් කරුණු සම්පූර්ණ විය යුතුවෙයි. එනම් ෂිෆ්ට් ලීවරය D,3,2 හෝ L පිහිටීමේ තිබිය යුතුය. පය බ්‍රේක් පැඩලයෙන් ඉවත්ව තිබිය යුතුය. එහිදී රෝද පසුපසට කැරකීම සිදුවෙයි නම් රථය කන්දක ධාවනය කරන බව වටහා ගන්නා ස්කිඩ් කොන්ට්‍රෝල් ECU එක මගින් වහා HAC ක්‍රියාත්මකව තත්පර පහක කාලයක් දක්වා බ්‍රේක් තද කරනු ලබයි.